**තේ පර්යේෂණ මණ්ඩලය - 2016**

**------------------------------------**

තේ පර්යේෂණ මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

---------------------------------------------

මණ්ඩලයට අයත් රත්නපුර හිදැල්ලන පිහිටි ශාන්ත ජෝකීම් වතුයායේ ගිණුම්ගතකරණ ලද මැණික් ඉල්ලම් සහිත ඉඩම් මැණික් ගැරීම සඳහා වෙන්දේසි කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට නිදහස් කිරීම සඳහා 2016 වර්ෂයේදී ගත් තීරණයක් අනුව 2017 වර්ෂයේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ලබාදී තිබුණද ප්‍රමිතයේ 12 වගන්තිය පරිදි ඒ සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

---------------------------------------------

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 57,209,881 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 50 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි එකිනෙකින් වෙන් කල හැකි වත්කම් වන අතර ඒවා වෙන් වෙන්ව වර්ගීකරණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන ශුද්ධ අගය රු. 226,166,964 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් එවැනි වර්ගීකරණයක් කර නොතිබුණි. ඒ අනුව ගොඩනැගිලි වෙනුවෙන් වූ ක්ෂය අගයෙහි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------

යම් නිශ්චිත ගිණුම් කටයුත්තක් වෙනුවෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද ගිණුම්කරණ ක්‍රමයෙන් ආවරණය නොවන්නේ නම් එහිදී වඩාත්ම යෝග්‍ය ආකාරයට (මනා පරිචය අනුව) කටයුතු කළයුතු අතර, ඒ බව සඳහන් කර ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පිළියෙල කර එය අනුගමනය කළයුතු වුවත්, මණ්ඩලය විසින් පහත සඳහන් වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති හඳුනාගෙන නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වෙන වටිනාකම රු.2,404,163 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කර ගිණුම්ගත කිරීම.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වෙන පිරිවැය රු.178,385,689 ක් වූ තේ වගාව මේරූ, නොමේරූ වශයෙන් වර්ග කර වෙන් වෙන්ව හඳුනා ගැනීම හා එම තේ වගාවන් හි භෞතික පැවැත්ම පිළිබඳව පරීක්ෂා කර පවතින ජීව තත්ත්වයන් පිළිබඳ සැලකිලිමත් නොවී ඉහත වටිනාකම් ගණනය කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රු. 11,727,594 ක් වැය කර නිම කරන ලද ජල පිරිපහදු ඒකකයේ පිරිවැය ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) කාර්ය මණ්ඩලය හා කම්කරුවන් වෙනුවෙන් අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී මූලික වැටුපට ජීවන වියදම් දීමනාව එකතුකර ඒ මත දායකය ගණනය කළයුතු වුවත් 2006 ජනවාරි සිට 2012 මැයි 30 දක්වා එසේ කටයුතු නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට රු.37,316,860 ක් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කළයුතු වුවත් ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. 2017 පෙබරවාරි 28 දින මෙම මුදල නිරවුල් කර තිබුණි.

(ඇ) තේ කම්හල් වල වර්ෂය තුළදී නොවිකුණූ නිමි තේ, අවසන් තොගය ලෙස ගිණුම් වලින් අනාවරණය කරනු වෙනුවට විකුණුම් ආදායම ගණනය කිරීමේදී ණයට විකුණුම් ලෙස සලකා ගිණුම් ගත කර තිබූ බැවින් වර්ෂයේ තේ විකුණුම් ආදායම හා ණයගැති ශේෂය රු.5,216,710 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් බදු පදනම මත බාහිර පාර්ශවයකට ලබා දී තිබූ ලැමිලියා තේ කම්හලේ යන්ත්‍ර සූත්‍ර 2003 වර්ෂයේදී රු.1,010,100 කට බදු ගැණුම්කරුවකුට අලෙවි කර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එම යන්ත්‍ර වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඉ) මණ්ඩලයට අයත් ඉඩම්වල ඇති ජීව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගත් ශාක 5654 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ශාන්ත කුම්බස් කම්හලෙහි ගිණුම් අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.256,641 ක් දක්වා තිබුණද අධිකාරියේ ගිණුම් අනුව එය රු.340,300 ක් ලෙස දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,853,977 ක් වූ විවිධ ණයගැතියන්ගෙන් සියයට 26 ක් එනම් රු.730,905 ක ණයගැතියන් වසර 05 ඉක්මවා තිබුණු නමුත් එම ශේෂ අයකර ගැනීම සඳහා කළමනාකරණය විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | **නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක්, තාවකාලික පදනමට වුවත් මණ්ඩලයේ නේවාසික ඉංජිනේරු තනතුර, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර සහ අංශ ප්‍රධානී තනතුරු 08 ක් සඳහා වර්ෂ 1 සිට වර්ෂ 7 දක්වා කාලයක් වෙනුවෙන් වැඩ බැලීමේ පදනම මත පත්කිරීම් කර පසුගිය වසර 07 තුල වැඩ බැලීමේ දීමනා ලෙස රු.2,648,179 ක් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 104 (2) | සමාලෝචිත වර්ෂය තුලදී ආයතනය සතු වාහන 5 ක් අවස්ථා 6කදී අනතුරු වලට භාජනය වී ඇතත් මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධ වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 316(2) | සුරක්ෂිත භාරයේ තැන්පත් කරනු ලබන හෝ එසේ තැබූ තැනකින් ඉවත්කරගනු ලබන හෝ ද්‍රව්‍ය පිළිබද වාර්තා වගකිවයුතු නිලධාරියකු විසින් පවත්වා ගතයුතු නමුත් ආයතනයේ සේප්පුවේ තැන්පත් කරනු ලබන මුදල් පිළිබඳ එවැනි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 396 | බැංකු ගිණුම් 03 කට අදාළව නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ වලංගු කාලය ඉක්මවූ රු.117,940 ක් වටිනා චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | මානව සම්පත් කළමනාකරණය සඳහා නීතිරීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත් මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

නිලධාරීන් විශ්‍රාම යාමේදී ඔවුන් විසින් ලබා නොගත් විවේක නිවාඩු වෙනුවෙන් ගෙවීම් කිරීමේ ක්‍රමවේදය සඳහා 1995 මාර්තු 17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම ලැබූ නිලධාරීන් 06 දෙනෙකුට ඉතිරි විවේක නිවාඩු වෙනුවෙන් රු. 213,634 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,599,148 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 13,302,192 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,703,044 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කුම්බස් වතුයායේ ලාභය රු.5,266,067 කින් වැඩිවීම හා ජෝකීම් වතුයායේ අලාභය රු.10,648,682 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඌනතාවයක් ලබා තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ දී රු.142,812,049 ක් වූ මණ්ඩලයේ දායකත්වය 2016 වර්ෂයේ රු.227,982,026 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ශාන්ත කුම්බ්ස් හා ශාන්ත ජෝකීම් වතුයායන් දෙකට අදාළ ඒඩීබී ව්‍යාපෘතියේ ලාභ අනුපාතය අවාසි සහගත වූ අතර පිළිවෙලින් සියයට (415) ක් හා සියයට (48) ක් විය. එමෙන්ම ඉකුත් වර්ෂයේ මෙම අනුපාතයන් පිළිවෙලින් සියයට (139) ක් හා සියයට (13) ක් විය. මෙම ව්‍යාපෘතිය මඟින් අලෙවිකරන ලද අතු රිකිලි ප්‍රමාණය වාර්ෂිකව පහලයාම මෙම අනුපාතය පිරිහීමට හේතුවී තිබුණි.

### 3.3 මණ්ඩලයට එරෙහිව හෝ මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සම්පූර්ණ වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබා පිටරට ගොස් නැවත දිවයිනට නොපැමිණි නිලධාරීන් 05 දෙනෙකු විසින් මණ්ඩලය සමග එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් රු.18,552,991 ක් වූ බැඳුම්කර සඳහා මුදල් අයකර ගැනීම වෙනුවෙන් මණ්ඩලය විසින් වසර 6 කට පෙර සිට නඩු පවරා තිබුණි.

(ආ) බාහිර පාර්ශවයක් විසින් මණ්ඩලය තෙවන විත්තිකරු ලෙස සඳහන් කරමින් ඉඩම් කොටස් අත්පත් කරගැනීම සඳහා 2012 වර්ෂයේදී ද මණ්ඩලයේ සේවකයකු විසින් කලින් දැරූ තනතුරට නැවත සේවය ලබා ගැනීම සඳහා 2015 වර්ෂයේදී ද මණ්ඩලයට එරෙහිව නඩු දෙකක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

--------------

තේ නිෂ්පාදනයේ ඵලදායීතාව සහ ගුණත්වය වඩාත් ලාභදායී ලෙස ඉහල නැංවීම සඳහා පර්යේෂණ කටයුතු වල නියැලීම ප්‍රමුඛ කරගනිමින් 2003 අංක 30 දරන පනතින් සංශෝධිත 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත මගින් ස්ථාපිත තේ පර්යේෂණ මණ්ඩලයේ අරමුණු කෙටියෙන් පහත පරිදි වේ.

- ❖ තේ වගාවේ රෝග සහ පළිබෝධ වැලැක්වීම සහ මර්ධනය, නිමි තේ වල ගුණත්වය ඉහළ නැංවීම, නිෂ්පාදන විවිධාංගීකරණ ආදී තේ වගාව සහ නිෂ්පාදනය සඳහා බලපාන සියළු ගැටළු සහ කරුණු පිළිබඳව පර්යේෂණ මෙහෙයවීම, සහයෝගය ලබා දීම සහ දිරිමත් කිරීම.

- ❖ ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ අනාගත ආර්ථික ප්‍රවනතා ද ඇතුලුව එම කර්මාන්තයේ ආර්ථික ස්වශක්තතාව පිළිබඳව පර්යේෂණ පැවැත්වීම. එහි ලා සහය වීම සහ ඊට අනුබල දීම.

- ❖ තලවාකැලේ පිහිටි තේ පර්යේෂණ ආයතන හා එහි උප ආයතන මණ්ඩලයේ රීතිවලට අනුකූලව පවත්වාගෙන යාම හා පරිපාලනය කිරීම.
- ❖ ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධතා ඇතිකර ගැනීම හා පවත්වාගෙන යාම.

- ❖ ස්වශක්ති කර්තව්‍ය ඉටු කිරීමේ දී, විදේශීය පර්යේෂණ ආයතන සහ ශ්‍රී ලංකාවේ පර්යේෂණ ආයතන සමග ඒකාබද්ධ අධ්‍යයන වැඩ පිළිවෙලවල්, සාකච්ඡා හා සම්මන්ත්‍රණ පැවැත්වීම, තේ පර්යේෂණ සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා තේ කර්මාන්තයට අදාල ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම.

උක්ත අරමුණු ඉටුකර ගැනීමේදී මණ්ඩලය ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ සහ අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් කාර්යසාධන ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

(අ) 2013-2017 වර්ෂයන්ට අදාල සංයුක්ත සැලැස්ම අනුව ඉටුකිරීමට අපේක්ෂිත වූ පර්යේෂණ 185 ක් වූ අතර විවිධ සීමාකාරී සාධක මත අතරමඟ අතහැර දමන ලද හෝ කල් දමන ලද පර්යේෂණ 38 ක් එනම්, සියයට 20 ක් විය.

(ආ) භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලද පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වූ ප්‍රදානයන්ගෙන් රු. 14,629,986 ක් වැය කරමින් ආරම්භ කරන ලද පර්යේෂණ 07 ක් අපේක්ෂිත අරමුණු කරා ලඟා නොවී අතරමඟ නවතා තබා තිබූ අතර ඒ සඳහා මානව සම්පතෙහි හිඟකම ප්‍රධාන වශයෙන් බලපා තිබූ බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඇ) පර්යේෂණ සඳහා අවශ්‍ය වන සංඛ්‍යා ලේඛන වාර්තා සැපයීම සඳහා පිහිටුවන ලද ජෛවමිතික අංශයේ කටයුතු භාරව සිටි නිලධාරියා සේවයෙන් ඉල්ලා අස්වීම මත 2013 වර්ෂයේ සිට එම අංශය වසාදමා තිබූ අතර මෙම ක්ෂේත්‍රයෙහි නිපුණත්වය සහිත නිලධාරියෙකු බඳවා ගැනීමට නොහැකිවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එය ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

(ඇ) 2013-2017 සංයුක්ත සැලැස්ම අනුව තේ වල ඇති සෞඛ්‍යමය වැදගත්කම හා එහි ඇති ප්‍රතිඔක්සිකාරක ගුණ අධ්‍යයනය සම්බන්ධයෙන් ජෛව රසායන අංශය මඟින් ඉටුකිරීමට සැලසුම්කරන ලද ව්‍යාපෘතීන් 4 න් එක් ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර ව්‍යාපෘතීන් 03 ක් ආරම්භ කිරීම කල්දමා තිබුණි. එකතුකළ වටිනාකම මත තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් සැලසුම් කරන ලද ව්‍යාපෘතීන් 3 ක් ආරම්භකර නොතිබූ අතර ව්‍යාපෘතීන් 2 ක් අතහැර දමා තිබුණි. මෙම ක්ෂේත්‍රයන්හි මානව සම්පත් හිඟතාවයද ව්‍යාපෘති ආරම්භ නොකිරීමට හේතු වී තිබුණි.

(ඉ) උපදෙස් හා ව්‍යාපෘති අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන නව තේ වගා ප්‍රභේදයන්ගෙන් රිකිලි සැපයීම සඳහා සිදුකරන ලද මවු ශාක වැඩසටහන මඟින් පසුගිය තෙවසරක කාලය තුලදී බෙදාහැරීමට ඇස්තමේන්තු ගත රිකිලි ප්‍රමාණයෙන් බෙදාදී තිබූ රිකිලි ප්‍රමාණය පිළිවෙලින් සියයට 67, 58 හා 59 ක් පමණක් වූයෙන් මෙම වැඩසටහනෙහි ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ලඟා වී නොතිබුණි.

(ඊ) තේ කර්මාන්තයේ පවතින ප්‍රධාන ගැටලුවක් වන උග්‍ර ශ්‍රම හිඟය සඳහා විසඳුමක් ලෙස 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද යාන්ත්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාරය විසින් කරන ලද රු.100,000,000 ක ප්‍රතිපාදනයෙන් 2014 වර්ෂය වන විට රු.48,000,000 ක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 44,848,107 ක් වැය කර තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ බෙදා හරින ලද යන්ත්‍ර මගින් අස්වනු හානි වීම හා ඉඩම් වල බෑවුම් සහිත වීම හේතුවෙන් එම යන්ත්‍ර භාවිතය අපහසුවීම නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඵලදායීව ඉටු වී නොතිබුණි. එබැවින් ඉහළයන ශ්‍රම හිඟය සම්බන්ධයෙන් සුදුසු විසඳුම් සොයාගැනීමේ යාන්ත්‍රීකරණ හා ආකල්ප වෙනස්කිරීමේ සාර්ථක වැඩපිළිවෙලක් වෙත මණ්ඩලයේ අරමුදල් යෙදවීම වඩා ඵලදායී බව නිරීක්ෂණය කෙරේ. මෙම ශ්‍රම හිඟය වළක්වා ගැනීම සඳහා සමාජ ආර්ථික මිනුම් හඳුනා ගැනීමට කෘෂි ආර්ථික විද්‍යා අංශය විසින් විවිධ ප්‍රදේශයන් වල සිදුකිරීමට සැලසුම් කරන ලද පර්යේෂණ 02 ක්ද සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කර නොතිබුණි.

(උ) මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන ශාන්ත කුම්බ්ස් සහ ශාන්ත ජෝකීම් වතුයායන් හා කම්හල සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) විගණනයට ඉදිරිපත් කරන තොරතුරු අනුව එක් එක් කම්හලේ තේ විකුණුම් ප්‍රමාණයන් හා නිෂ්පාදන පිරිවැය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පහත පරිදි විය.

| විස්තරය | ශාන්ත ජෝකිම් කර්මාන්තශාලාව | | ශාන්ත කුම්බ්ස් කර්මාන්තශාලාව (ලැමිලියර් කොටසද ඇතුළුව) | |
|---|---|---|---|---|
| ---------- | 2016 | 2015 | 2016 | 2015 |
| තේ අමුදළු යෙදවීම (කිලෝග්‍රෑම්) | 955,943 | 955,206 | 1,596,530 | 1,780,384 |
| තේ නිෂ්පාදනය (කිලෝග්‍රෑම්) | 202,301 | 203,273 | 358,752 | 393,378 |
| තේ විකුණුම් (කිලෝග්‍රෑම්) | 202,266 | 201,727 | 348,896 | 388,417 |
| නිෂ්පාදන පිරිවැය (කිලෝග්‍රෑමයකට රු.) | 487.42 | 436.15 | 508.67 | 481.10 |
| ශුද්ධ විකුණුම් සාමාන්‍යය (කිලෝග්‍රෑමයකට රු.) | 483.23 | 393.09 | 541.91 | 475.93 |
| නිමවුම් අනුපාතය (සියයට)<br>*ප්‍රශස්ත නිමවුම් අනුපාතය සියයට 21.5 | 21.16 | 21.2 | 22.47 | 22.09 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමාලෝචිත වර්ෂයේ ශාන්ත කුම්බ්ස් කර්මාන්තශාලාවෙහි තේ විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉහළගොස් පැවතියද, විකුණුම් ප්‍රමාණය සියයට 09 කින් පහත වැටී තිබුණි. එමෙන්ම ශාන්ත කුම්බ්ස් තේ කර්මාන්තශාලාවට අයත් තේ වතුයායන්හි ඵලදායීත්වය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 17 කින් පහල වැටී තිබීම එහි තේ නිෂ්පාදනය අඩුවීමට බලපා තිබුණි.

- කම්හල් දෙකෙහිම ශ්‍රම ඵලදායීතාවය, දර භාවිතය හා විදුලි ඒකකයන්හි ඵලදායීතාව අපේක්ෂිත මට්ටමට ළඟාවී නොතිබීම හේතුවෙන් තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩි වී තිබුණි. එසේම ශාන්ත ජෝකිම් කම්හලෙහි ඒකකයක නිෂ්පාදන පිරිවැය ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිල ඉක්මවා තිබුණි.

(ii) ශාන්ත කුම්බ්ස් හා ශාන්ත ජෝකිම් වතුයායන් දෙකෙහි ක්‍රියාකාරී සැලැස්ම අනුව අමු තේ දළු යෙදවීම පිළිවෙලින් කිලෝග්‍රෑම් 2,120,306 ක් හා කිලෝග්‍රෑම් 1,836,826 ක් වූ අතර තථ්‍ය යෙදවීම පිළිවෙලින් කිලෝග්‍රෑම් 1,596,530 ක් හා කිලෝග්‍රෑම් 955,943 ක් වුයෙන් විචලනය සියයට 24 ක් හා සියයට 52 ක් විය. එම නිසා ඊට අනුරූපීව නිමිතේ ප්‍රමාණයද විචලනය වී තිබුණි.

(ඌ) නියමිත ප්‍රමිතියෙන් යුතු තේ පැල ලබාදීමේ අරමුණින් ශාන්ත ජෝකිම් වතුයායේ හා ශාන්ත කුම්බ්ස් වතුයායෙහි පවත්වාගෙන යනු ලබන පැල තවාන් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) පසුගිය දෙවසරක කාලය තුල ශාන්ත ජෝකිම් වතුයායේ පවත්වාගෙන යනු ලබන තේ පැල තවානේ යෙදූ පැල සංඛ්‍යාවෙන් සියයට 34 ක් පමණ අසාර්ථක පැල වූ අතර තවාන් පාලනය සඳහා ලබාදී තිබූ උපදෙස් නියමිත පරිදි ක්‍රියාත්මක කර නොතිබීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ii) ශාන්ත කුම්බ්ස් වතුයායේ පවත්වාගෙන යනු ලබන පැල තවාන මනා ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පැල 23,495 ක් ඉවත් කර තිබූ අතර එම පැල ඉවත්කිරීමේ පාඩුව රු.659,687 ක් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලීය පුස්තකාලයේ පොත් 1978 වර්ෂයේ සිට භෞතික පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර පසුගිය වසර 20 ක කාලය තුල (1985 – 2016) බැහැර ගෙන යනු ලැබූ පොත් වලින් ආපසු භාර නොදුන් පොත් සම්බන්ධයෙන් නැවත ගෙන්වා ගැනීමට හෝ වටිනාකම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) යම් කාර්යයක් සඳහා බාහිර ආයතනයක් වෙත අත්තිකාරම් මුදලක් නිදහස් කිරීමට පූර්වයෙන් අදාල කාර්යය ඉටුකිරීමට ශක්‍යතාවයක් පවතීද යන්න සනාථ කරගත යුතු වුවත් ඒ පිළිබඳ සැලකිලිමත් නොවී 2011 වර්ෂයේදී මතුගම ප්‍රාදේශීය කාර්යාලය සඳහා ජල ආශ්‍රිත ඒකකයක් මිලදී ගැනීමට රු.110,124 ක් අත්තිකාරම් පෞද්ගලික ආයතනයකට ලබාදී තිබුණද, එම ආයතනය වසා දමා ඇති බවට හඳුනාගෙන ඇතත් එම වටිනාකම පියවා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන වාහන 8 ක් හා දෙනියාය සහ කොට්ටාව ප්‍රාදේශීය කාර්යාලයන් ඉදිකර තිබූ ඉඩම්වල අයිතිය මණ්ඩලය වෙත පවරා ගැනීමට 2017 ජුනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඈ) ශාන්ත ජෝකිම් වතුයායට අයත් හෙක්ටයාර් 05 ක් පමණ වූ ඉඩම් වසර 26 කට අධික කාලයක සිට බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබූ අතර එම ඉඩම් නැවත මණ්ඩලය වෙත ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) ශාන්ත ජෝකිම් වතුයායට අයත් හෙක්ටයාර් 8.74 ක් වූ කුඹුරු ඉඩම් අඳගොවීන් විසින් වගාකරනු ලබන අතර ඉන් මණ්ඩලයට අයවිය යුතු ආදායම් කොටස අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම රබර් හා පොල් වතුවල ඇති ගස් ප්‍රමාණය ගණනය කර ලේඛනගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඊ) පර්යේෂණ කටයුතු සඳහා මිලදීගෙන ඒ ඒ පර්යේෂණ අංශයෙහි ගබඩාවල තැන්පත් කර තිබූ රසායනික ද්‍රව්‍ය තොග ශේෂයෙහි වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

ජීවන මට්ටම ඉහල නැංවීමේ ව්‍යාපෘතිය සහ යාන්ත්‍රීකරණ ව්‍යාපෘතිය යන විශේෂ ව්‍යාපෘතීන් සඳහා 2013 හා 2014 වර්ෂවලදී මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු පිළිවෙලින් රු. 8,151,671 ක් හා රු. 9,500,000 ක් සමාලෝචිත වර්ෂයේ දී ද ඒ වෙනුවෙන් වැයකර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශාන්ත කුම්බස් වතු වෛද්‍ය සහායක භාරයේ පැවති රු. 201,408 ක් වටිනා බෙහෙත් ද්‍රව්‍ය තොගය වර්ෂ 04 ක් සිට භාවිතයට නොගෙනීම නිසා භාවිතයෙන් ඉවත් කර තිබුණි.

(ආ) මණ්ඩලය සතු නිල නිවාස අතරින් ඒ කාණ්ඩයේ නිල නිවාසයක් 'ඩී' කාණ්ඩයේ නිල නිවාස 11 ක් හා 'ඊ' කාණ්ඩයේ නිල නිවාස 7 ක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ශාන්ත කුම්බස් වතුයායේ හා ශාන්ත ජෝකිම් වතුයායේ යන්ත්‍ර ධාරිතාවය දිනකට පිළිවෙලින් අමු තේ දළු කිලෝ ග්‍රෑම් 8,000 ක් හා කිලෝ ග්‍රෑම් 15,000 ක් විය. එසේ වුවද එම යන්ත්‍රවල තථ්‍ය සාමාන්‍ය උපයෝජනය පිළිවෙලින් දිනකට කිලෝග්‍රෑම් 5,000 ක් එනම් සියයට 62 ක් සහ කිලෝ ග්‍රෑම් 6,253 ක් එනම් සියයට 17 ක් බව නිරීක්ෂණය විය.

(ඈ) ශාන්ත කුම්බස් කර්මාන්තශාලාව ආරම්භයේදී සවිකර තිබෙන රෝල යන්ත්‍ර 04 කින් නිෂ්පාදන ක්‍රියාකාරිත්වය සඳහා වරකට භාවිතයට ගනු ලබන්නේ යන්ත්‍ර 02 ක් පමණි. එබැවින් යන්ත්‍ර 02 ක් නිතරම ක්‍රියාකාරිත්වයෙන් තොරව පවතින බව නිරීක්ෂණය විය. තවද සැවේජ් කටර් යන්ත්‍රයද භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර, E.C.P.4 Drier යන්ත්‍රය ද වසර 16 ක සිට භාවිතයෙන් තොරව පවතී.

(ඉ) ශාන්ත ජෝකිම් කම්හලේ දර භාවිතයෙන් තේ දළු වියලන යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීම හේතුවෙන් ඉන්ධන භාවිතයෙන් තේ දළු වියලන යන්ත්‍රය නිෂ්කාර්යව පැවති අතර කර්මාන්තශාලාවට ලැබෙන අමු දළු ප්‍රමාණය අඩුවීම හේතුවෙන් ස්ටෙක්ස් එස්ට්‍රැක්ටරය වසර 03 ක සිට භාවිතා කර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

2016 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 443 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 253 ක් වීමෙන් තනතුරු 190 ක් පුරප්පාඩු වී පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධායක මට්ටමේ අනුමත නිලධාරීන් 87 කින් පුරප්පාඩු තනතුරු 38 ක් පැවති අතර ඒ සඳහා සේවක සංඛ්‍යාවෙන් තනතුරු 23ක් අභ්‍යන්තර උසස්වීම් වන අතර එම තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව අදාළ සුදුසුකම් සහිත නිලධාරින් නොමැති නිසා වර්ෂ 05 ක කාලයක සිට පත්කිරීම් කල නොහැකිව පැවතුණි.

(ආ) විධායක නොවන මට්ටමේ තනතුරු 97 ක් පුරප්පාඩුව පැවති අතර ඊට ඇතුළත් පර්යේෂණ හා සංවර්ධන තාක්ෂණ නිලධාරින්ගේ සහ ව්‍යාප්ති නිලධාරීන්ගේ අනුමත තනතුරු සංඛ්‍යාව පිළිවෙලින් 50 ක් හා 24ක් වූ නමුත් ඉන් තනතුරු 33 ක් සහ 17 ක් එනම් සියයට 68 ක් පුරප්පාඩුව පැවතුණි. එබැවින් මණ්ඩලයේ පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු සැලසුම් අනුව ඉලක්කගත කාලය තුල ඉටුවී නොතිබුණි.

(ඇ) ස්ථාන භාර නිලධාරී (ඕ.අයි.සී) තනතුර මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොපවතින නමුත් නිලධාරීන් 08 දෙනෙකු සඳහා එම තනතුරෙහි කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් එම තනතුරු 08ක් සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබා දී දීමනා ලෙස 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 1,278,320 ක් ගෙවා තිබුණි.

(ඈ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි තාවකාලික හෝ අනියම් පදනම මත බඳවා ගෙන ඒ වන විටත් සේවයේ යෙදී සිටි සේවකයින් 112 දෙනෙකුට (ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 105 ක් හා කළමනාකරණ සහකාර තනතුරු 07ක් ) 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබා දී තිබුණි. කෙසේවුවද 2016 දෙසැම්බර් 31 දිනට පී එල්-1 යටතේ අනුමත සාමාන්‍ය කම්කරු තනතුරු ගණන 65 ක් වුවත් එම තථ්‍ය කාර්යමණ්ඩලය 104 ක් බැවින් 39 දෙනෙකුගේ අතිරික්තයක් විය.

## 4.6 වාහන පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ධාවනයෙන් ඉවත් කරන ලද රථයක එන්ජිම වෙනත් වාහනයකට සවිකර ඇතත් මෙම වාහන ලියාපදිංචි සහතික සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ නියමයන් අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) පැජරෝ ජීප් රථයක් වර්ෂ 5ක කාලයක සිට අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කිරීමෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

---------------------

මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර තිබූ නමුත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන පර්යේෂණ කටයුතු සම්බන්ධව මූල්‍ය හෝ භෞතික කාර්යසාධනය පිළිබඳ කිසිදු පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

අයවැය ලේඛනයේ අයවැයගත හා තථ්‍ය ආදායම්, වියදම් අතර සියයට 13 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය කාර්යාලවල ස්ථාන භාර නිලධාරීන්ගේ නිල නිවාස නඩත්තු කිරීම සඳහා මාසික කම්කරු දීමනාවක් ප්‍රතිපූරණය කිරීමට 2007 මැයි 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. මෙම කම්කරු දීමනාව දෛනික කම්කරු වැටුපට නිෂ්පාදන ප්‍රසාද දීමනා, අතිකාල, පැමිණීමේ දීමනා යනාදිය එකතු කර ගණනය කර තිබුණු අතර 2016 පලමු මාස 09 තුල නිලධාරීන් 10 දෙනෙකු සඳහා රු.1,790,177 ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. මේ සඳහා භාණ්ඩාගාරයේ හා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර 2014 නොවැම්බර් 19 දින රාජ්‍ය ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ද එම අනුමැතීන් ලබා ගැනීමට උපදෙස් ලබාදී තිබුණි.

(ආ) මණ්ඩලය විසින් ඒ ඒ විෂයයන්ට අදාල චක්‍රලේඛ නියමයන් හා අනෙකුත් සමාන ආයතන අභිබවා කාර්ය මණ්ඩලය වෙත ලබා දෙනු ලබන නිවාඩු, නිලනිවාස හා එහිදී පරිභෝජනය කරනු ලබන ජලය, විදුලිය වෙනුවෙන් ගාස්තු අය නොකිරීම වැනි වරප්‍රසාද සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) තේ සැකසුම් කිරීම සඳහා ආයතනය විසින් 1982 වර්ෂයේදී රු.4,142,173 ක් වැය කර ආනයනය කරන ලද යන්ත්‍ර අදාල ව්‍යාපෘතිය සඳහා යෝග්‍ය නොවූ බැවින් නිෂ්කාර්යව පැවතුණි. මෙම වටිනාකම භාණ්ඩාගාර අනුමැතිය මත පොත්වලින් කපාහැරීමට කටයුතු කරන බව දන්වා තිබුණද මේ දක්වා ගිණුම්වලින් ඉවත් කර නොතිබුණු අතර කෙරීගෙනයන වැඩ ලෙස තවදුරටත් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් වූ අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු වියයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබීම. |
| (ආ) | වත්කම් පාලනය | වාහන අයිතිය පවරාගැනීම සිදු කර නොතිබීම හා අළුත්වැඩියා කටයුතු නිසි පරිදි නියාමනය කර නොතිබීම. |
| (ඇ) | පොත් පත් ලේඛන පවත්වා ගැනීම | විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබීම, මණ්ඩලයට අයත් ඉඩම්, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබීම, කුවිතාන්සි පොත් සම්බන්ධව ජී.ඒ. ඇන් 20 ප්‍රකාරව ලේඛනයක් නඩත්තු කල යුතු නමුත් රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබීම. |
| (ඈ) | අයවැය පාලනය | අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වීම. |
| (ඉ) | පර්යේෂණ කටයුතු | පර්යේෂණ කටයුතු නියාමනය කිරීම දුර්වල මට්ටමක පැවතීම. |
| (ඊ) | ගබඩා පාලනය | පර්යේෂණ කටයුතු සඳහා මිලදීගෙන තිබූ රසායනික ද්‍රව්‍ය මධ්‍යගත ගබඩාවක රැස් කර අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් නිකුත් කිරීමේ පිළිවෙතක් අනුගමනය නොකර පර්යේෂණ අංශයන්ගේ ගබඩාවන්හි තැන්පත් කර නිකුත් කිරීම හේතුවෙන් එකම වර්ගයේ රසායනික ද්‍රව්‍ය විවිධ ප්‍රමාණයන්ගෙන් ස්ථාන කිහිපයක ගබඩා කර තිබීමත්, ඇතැම් රසායනික ද්‍රව්‍ය කල් ඉකුත් වීමටත් සහ අනවශ්‍ය තොග පැවතීමත් සිදුවී තිබීම. |